2. වෛද්‍ය පරීක්ෂණාගාර හෝ වෛද්‍ය උපකරණ භාවිත කරන ස්ථාන තුළ හෝ ආශ්‍රිතව;

## රඟදැක්වීම් ආශ්‍රිත රැකියා

1. දැවෙන සුළු ද්‍රව්‍යයක් හෝ ගින්දර භාවිතා කරමින් සිදුකරනු ලබන රඟපෑමක් සම්බන්ධ වන;
2. සර්කස් හෝ ජිම්නාස්ටික් රඟපෑම්වලට සම්බන්ධ වන හෝ වෙනත් අනතුරුදායක රඟපෑම් හෝ සතුන් හැසිරවීමට අදාළව;
3. චිත්‍රපටයක, රූපවාහිනී නාට්‍යයක හෝ වෙනත් යම් මුද්‍රිත, සම්ප්‍රේෂිත හෝ ප්‍රකාශිත ද්‍රව්‍යයකට අදාළව සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට හානිදායක;

## ආහාර පිළියෙල කිරීම ආශ්‍රිත රැකියා

1. වෙළඳ ආයතනවල ඉවීම හෝ පිලිස්සීමට (baking) සම්බන්ධ වන;

## මෘත ශරීරාගාර ආශ්‍රිත රැකියා

1. මෘත ශරීරාගාරයක්, අවමංගල්‍ය ශාලාවක හෝ සුසාන භූමියක් තුළ;

## වෙනත් රැකියා

1. යම් තරුණ අයකුගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හානිදායක විය හැකි;

## දඬුවම්



- **රු. 10,000.00 දඩයක් වසරක සිර දඬුවමක් හෝ ඉහත සඳහන් දඬුවම් දෙකම සමග අධිකරණයේ අභිමතය පරිදි අගතියට පත් දරුවාට වන්දි මුදලක්.**
- **වයස අවුරුදු 18 ට වඩා අඩු තැනැත්තන් අන්තරායකාරී රැකියාවල සේවයේ යොදවා නීතියේ රැහැනට හසුනොවන්න.**
- **එවැනි අවස්ථා දුටු සැනින්, නිවැරදි තොරතුරු ලබාදීම මගින් යහපත් තරුණ පරපුරක් අනාගතයට දායාද කිරීමට ඔබටත් දායක විය හැකිය.**

**කාන්තා හා ළමා කටයුතු අංශය,**
**කම්කරු දෙපාර්තමේන්තුව**
12 වන මහල, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන අංක - 0112 104860 - 65
ෆැක්ස් - 0112 369800
ඊ මේල් - wca@labourdept.gov.lk
wca.division@gmail.com

**වයස අවුරුදු 18 ට අඩු කිසිම තැනැත්තෙකු**

# අන්තරායකාරී

# රැකියා ක්ෂේත්‍රයන්හි යෙදවීම තහනම්



සෞඛ්‍ය, ආරක්ෂාව හා සදාචාරයට හානි විය හැකි බවට හඳුනාගෙන ඇති අන්තරායකාරී රැකියා

**කාන්තා හා ළමා කටයුතු අංශය**
**කම්කරු දෙපාර්තමේන්තුව**

**1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතේ 2006 අංක 24 දරන සංශෝධනය අනුව පනතේ 20 අ වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ වයස අවුරුදු 18ට අඩු කිසිවකු අන්තරායකාරී රැකියාවල හෝ රැකියාවක යෙදවීම තහනම් කොට ඇත.**

කම්කරු දෙපාර්තමේන්තුව කාලයක් තිස්සේ සිදු කරන ලද විද්‍යාත්මක හා විශේෂඥ පර්යේෂණ වලින් පසුව වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින්ගේ කායික හා මානසික සෞඛ්‍යයට හා ආරක්ෂාවට හානිකර රැකියා 51 ක් අන්තරායකාරී රැකියා බවට හඳුනාගෙන ඇත. එම රැකියා ලැයිස්තුව අංක 2254/35 හා 2021.11.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රැකියා 71 ක් ලෙස පුළුල් කර ඇත.



## අන්තරායකාරී රැකියා හඳුනාගනිමු

### ගෘහස්ත සේවය

1. ගෘහස්ථ සේවකයෙකු ලෙස

### මස් / මාළු / ලුණු ආශ්‍රිත රැකියා

1. සත්ත්ව ඝාතකාගාරයක හෝ සතුන්ගේ මස් කැපීමේ, පිරිසිදු කිරීමේ, කැබලි කිරීමේ කාර්යයකට සම්බන්ධ වන;
2. සත්ත්වයන් රැක බලා ගන්නාවූ, පෝෂණය කරන්නාවූ සහ ඔවුන් පුහුණු කිරීමට සම්බන්ධ වන;
3. ඉස්සන් ගොවිපළ හෝ ජල්ලි (Jelly fish) ගොවිපොළ ඇතුළුව ජලජ සතුන් හා ශාක ඇති කිරීමට අදාළ වන;
4. වාණිජමය ධීවර කටයුතු හෝ ගැඹුරු දියේ ධීවර කටයුතුවලට අදාළ;
5. ලුණු අස්වැන්න නෙලීමට, ඇසුරුම් කිරීම, පැටවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;



### පලිබෝධ නාශක/ රසායන ද්‍රව්‍ය/ ගිනි කෙළි ආශ්‍රිත රැකියා

1. පලිබෝධ නාශක, වල්පැළෑටි නාශක හෝ දිලීරනාශක ඇතුළුව කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, විකිණීම, හැසිරවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;
2. මාළු, මස්, එළවළු හෝ පළතුරු ඇතුළුව ආහාර ද්‍රව්‍ය සකස් කිරීම සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය සහ පළතුරු ඉදවීමට රසායන ද්‍රව්‍ය භාවිතා කිරීමට සම්බන්ධ වන;



3. උපද්‍රවකාරී රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;
4. විකිරණශීලී ද්‍රව්‍ය භාවිතය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;
5. ඊයම්, සින්ක්, ආසනික්, රසදිය, ක්‍රෝමියම්, නිකල්, රිදී, කැඩ්මියම් හෝ වෙනත් යම් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හෝ සංයුතීන් නිෂ්පාදනය, හැසිරවීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීමට සම්බන්ධ වන;
6. පුපුරන ද්‍රව්‍ය හෝ ගිනි අවි නිෂ්පාදනය, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීම පිළිබඳ කටයුතු කරන;
7. රතිඤ්ඤා හෝ වෙනත් යම් පුපුරන සුළු ද්‍රව්‍ය නිපදවීමට හෝ විකිණීමට සම්බන්ධ වන;

### මත්පැන් / දුම්කොළ ආශ්‍රිත රැකියා

1. මද්‍යසාර හෝ රා නිෂ්පාදනය, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීමට සම්බන්ධ වන;
2. දුම්කොළ වගා කිරීම, අස්වැන්න නෙලීම, ඇසිරීම, හැසිරවීම හෝ ප්‍රවාහනයට සම්බන්ධ වන;
3. දුම්කොළ නිෂ්පාදන නිපදවීම, ප්‍රවාහනය, හැසිරවීම හෝ විකිණීමට සම්බන්ධ වන,
4. සමාජ ශාලාවක්, මත්පැන්හලක් හෝ කැසිනෝ ආයතනයක් තුළ හෝ ඒ ආශ්‍රිතව;

5. අවන්හලක, ආපනශාලාවක, භෝජනාගාරයක හෝ මත්පැන්හලක මත්පැන් පිළිගැන්වීම සම්බන්ධ වන;

## රබර් / සම්පදම් කිරීම ආශ්‍රිත රැකියා


1. සම් පදම් කිරීමට සම්බන්ධ වන;
2. රබර් කිරිවලට රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් රබර් ෂීට් නිපදවීමට සම්බන්ධ වන;

## යන්ත්‍ර සූත්‍ර / වරාය ආශ්‍රිත රැකියා

1. ක්‍රියාකාරීව පවතින යන්ත්‍රෝපකරණ සහ තියුණු දාර සහිත යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම, පිරිසිදු කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ අලුත්වැඩියා කිරීමට සම්බන්ධ වන;
2. ඇඹරුම්හල් තුළ හෝ ඒ ආශ්‍රිතව;
3. වරායක, තොටුපළක, මුහුදු බොක්කක, අංගනයක, ජැටියක හෝ ගංගා මෝයක් තුළ බර උසුලාගෙන යෑම හෝ ශාරීරිකව තුවාල සිදුවිය හැකි යම් උපකරණ භාවිතයට සම්බන්ධ වන; හෝ
4. බෝට්ටු ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වන;
5. වඩු කර්මාන්තයේ දී යම් දැවමය උපාංගයක් හෝ ගෘහ භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා ආයුධ භාවිතා කිරීම, පිරිමැදීම හෝ දැව ආරක්ෂණ ඉසීමට සම්බන්ධ වන;
6. බර වාහනවල ටයර් මාරු කිරීමට සම්බන්ධ වන;

## පතල්/ ගල් කෝරි/ වැලි, උළු, ගඩොල්/ හුණුගල් ආශ්‍රිත රැකියා

1. හුණුගල්, සිලිකේට්, ඇස්බැස්ටෝස් හෝ සිමෙන්ති නිෂ්පාදනයට හෝ හැසිරවීමට සම්බන්ධ වන;
2. භූගත ස්ථානයක හෝ ගුහාවල් තුළ;
3. පතල් හෑරීමේදී ගල් කැඩීම, ගල් තැලීම හෝ ගල් කැඩීමේ යන්ත්‍රයකට ගල් ගෙනයාම හෝ ඉන් ගෙන ඒම;
4. තොටුපලක හෝ ඒ ආශ්‍රිතව වැලි ගොඩ දැමීමට සම්බන්ධ වන;
5. වාහනයකට හෝ යාත්‍රාවකට වැලි පැටවීම හෝ වැලි බෑමට සම්බන්ධ වන;
6. හුණුගල් පෝරණුවක;
7. පතලක හෝ ගල්වලක;
8. ගඩොල් හෝ සෙවිලි උළු නිෂ්පාදනය කරන පෝරණුවක;



## ඉදිකිරීම්/ වැඩබිම් ආශ්‍රිත රැකියා

1. ඉදිකිරීම් කටයුතු මෙහෙයවීමේ කාර්යාලයක් තුළ වූ සැහැල්ලු කාර්යාලීය වැඩකටයුතු හැර ඉදි කිරීමේ වැඩබිම් පරිශ්‍රවල හෝ එය ආශ්‍රිතව;
2. (අ) මීටර 1.5 ට වඩා උස (සියළුම පැති) යම් ස්ථානයක ආරක්ෂක පියවර සපයා නොමැතිවිට; හෝ

   (ආ) මීටර් 3ට වඩා උස (සියළුම පැති) යම් ස්ථානයක ආරක්ෂක පියවර සපයා තිබුණද; කිසියම් පිහිටීමක;
3. (අ) යම් බරක්, පුරුෂයින් සම්බන්ධයෙන් කිලෝග්‍රෑම් 8 ට වැඩි බරක් හා ස්ත්‍රීන් සම්බන්ධයෙන් කිලෝග්‍රෑම් 5 ට වැඩි බරක්, මීටර් 50 ට වැඩි දුරක් අවම වශයෙන් විනාඩි 3 ක වත් විවේකයක් නොමැතිව මිනිත්තු 10 ට වැඩි අඛණ්ඩ කාල සීමාවක් සඳහා සහ (විවේකය ද ඇතුළුව) දවසකට පැය 4 ට වැඩි සමස්ත කාලසීමාව තුළ එසවීමට, ඔසවාගෙන යාමට හෝ ඉවත් කිරීමට සම්බන්ධ වන; හෝ

   (ආ) යම් බරක්, පුරුෂයන් සම්බන්ධයෙන් කිලෝග්‍රෑම් 8 ට වැඩි බරක් හා ස්ත්‍රීන් සම්බන්ධයෙන් කිලෝග්‍රෑම් 5 ට වැඩි බරක්, අවම වශයෙන් විනාඩි 3 ක වත් විවේකයක් නොමැතිව මිනිත්තු 10 ට වැඩි අඛණ්ඩ කාලසීමාවක් සඳහා සහ (විවේකයද ඇතුළුව) දවසකට පැය 2 ට වැඩි සමස්ත කාල සීමාවක්ද වාහනයකට පැටවීම හෝ වාහනයකින් බෑමට සම්බන්ධ වන;

   එසේ වුවද, පුරුෂයන් සම්බන්ධයෙන් වන විටදී බර කිලෝග්‍රෑම් 10 ට වැඩි නොවිය යුතු අතර ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන විට දී බර කිලෝග්‍රෑම් 7 ට වැඩි නොවිය යුතුය.
4. ගොඩනැගිලි පින්තාරු කිරීමට සම්බන්ධ වන;
5. මාර්ග ඉදිකිරීමේ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා පොළොව මට්ටම් කිරීම, සමතලා කිරීම හෝ තාර දැමීමට සම්බන්ධ වන;

## වානේ/ වීදුරු/ ඛනිජ ද්‍රව්‍ය/ පිත්තල වැඩ ආශ්‍රිත රැකියා

1. ලෝහ උණු කිරීමට සම්බන්ධ වන;
2. වීදුරු කර්මාන්තය සඳහා වැලි හැලීමට සම්බන්ධ වන;
3. වීදුරු උණු කිරීමට හෝ කැපීමට සම්බන්ධ වන;
4. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය හෝ සිලිකන් වාත්තු කිරීමේ කර්මාන්තයට සම්බන්ධ වන;
5. වාත්තු වැඩපළක හෝ ලෝහ තැලීමේ ස්ථානයක;
6. වීදුරු හෝ වීදුරු භාණ්ඩ ඇසුරුම් කිරීම, හැසිරවීම, පැටවීම හෝ බෑමට සම්බන්ධ වන;
7. ටයිල් කැපීමට සම්බන්ධ වන;

## ප්‍රවාහන / සංචාරක ආශ්‍රිත රැකියා

1. මගීන් ප්‍රවාහනයට සම්බන්ධ වන;
2. මාර්ගෝපදේශකයකු ලෙස සංචාරකයන් සමඟ සම්බන්ධ වන;

## ගස් නැගීම හා කැපීම/ දර කැපීම, දර එකතු කිරීම ආශ්‍රිත රැකියා

1. වනාන්තරයක් තුළ හෝ වෙනත් යම් වැඩ පොළක දර එකතු කිරීම, පැලීම, කපා හෙලීම, දර කුට්ටි කිරීම හා සම්බන්ධ වන;
2. ගස්වලට නැගීම හෝ ගස් කපා බිම හෙලීම හා සම්බන්ධ වන;

## සන්නද්ධ ගැටුම් / ආරක්ෂක සේවා ආශ්‍රිත රැකියා

1. පුද්ගලයන්ට, දේපලවලට හෝ සතුන්ට ආරක්ෂාව සැපයීමට සම්බන්ධ වන;

## කැලි කසල, මළාපවහනය ආශ්‍රිත රැකියා

1. කැලි කසල හා අපද්‍රව්‍ය රැස් කිරීම, බැහැර කිරීම හෝ ශෝධනය කිරීම හෝ කාණු, ඇල මාර්ග හෝ ජලාපවහන පද්ධති පිරිසිදු කිරීමට සම්බන්ධ වන;
2. සායනික හෝ ජෛව අපද්‍රව්‍ය සම්බන්ධ වන;



## රෙදි නිමි ඇඳුම් ආශ්‍රිත රැකියා

1. රෙදිපිළි නිෂ්පාදනයේ පහත දැක්වෙන කාර්යයන්ට සම්බන්ධ වන:-


   (අ නූල් කැටීම; (ආ) පුළුන් කිරීම;
   (ඇ) නූල් එතීම; (ඈ) විවීම;
   (ඉ) ඉටි උණුකිරීම; (ඊ) සායම් මිශ්‍ර කිරීම;
   (උ) අච්චුවල යෙදීම; සහ
   (ඌ) ජලය උරා ගැනීමේ යන්ත්‍රවල වැඩ කිරීම යන්නට අදාළ;

2. නිමි ඇඳුම් නිෂ්පාදනයේ පහත දැක්වෙන යම් කටයුතුවලට සම්බන්ධ වන;

   (අ) ගොඩ ගැසීම;
   (ආ) පිහියෙන් හෝ අත් පිහියකින් කැපීම; සහ
   (ඇ) නිමා කිරීම, වියලීම සහ මැදීම; යන්නට අදාළ;

## ජලය ආශ්‍රිත රැකියා

1. පිහිනුම් තටාක තුළ හෝ ආශ්‍රිත නඩත්තු කටයුතුවල;
2. කිමිදීම සම්බන්ධ වන;
3. වගුරු බිම්වල ඇවිද ගොස් මල් නෙලීමට සම්බන්ධ වන;
4. විලක, පොකුණක, ඔයක, ගංගාවක, ජලාශයක, වාප්පුවක ඇලක හෝ වෙරලක හෝ ඒ ආශ්‍රිතව;
5. රට තුළ ජලයෙහි හෝ මුහුදු තීරයෙහි මෙහෙයවන යාත්‍රාවක් තුළ;



## විදුලිය ආශ්‍රිත රැකියා

1. අධි වෝල්ටීයතාවයකින් යුතු විදුලි රැහැන් සම්බන්ධ වන;

## රූපලාවන්‍ය/සෞඛ්‍ය ශෝභාගාර ආශ්‍රිත රැකියා

1. රූපලාවන්‍යාගාරයක රසායනික ද්‍රව්‍ය හෝ රූපලාවන්‍ය ද්‍රව්‍ය භාවිතයට සම්බන්ධ වන;
2. සෞඛ්‍ය ශෝභාගාරයක් (spa) තුළ;

## වෛද්‍ය/ ඉලෙක්ට්‍රොනික උපකරණ ආශ්‍රිත රැකියා

1. මානසික යහපැවැත්මට හෝ මාර්ගගත ප්‍රවේශයන්ට හානිදායක වන්නාවූ පරිගණක හෝ ඉලෙක්ට්‍රොනික උපකරණවලට අදාළව;